**කල්පිටිය ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කල්පිටිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය තුල ඇති රු.106,000ක් වටිනා අපහරණයට යෝජිත ජල බවුසරයක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි. | එකඟ වෙමි. 2021 ගිණුමට එකතු කිරීමට කටයුතු කරමි. | අදාල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට ගිණුමේ සඳහන් ණයගැති ශේෂය රු.82,176ක් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වෙමි. 2021 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් ශේෂ මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමේදී නිවැරදි තාවය තහවුරු කරගත යුතුවේ. |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛන තුල ඇතුළත් වටිනාකම රු.6,375,200 ක්වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | එකඟ වෙමි. 2021 ගිණුම සකස් කිරීමේදී ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කරමි. | අදාල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. |
| (ඈ) | ඉඩම් කට්ටි කර විකිණීමේදී සභාව විසින් අයකරගෙන තිබුණු සියයට 1ක බද්ද වූ රු.1,028,100ක් ආදායමට නොගෙන තැන්පතු ගිණුම්වල රඳවාගෙන තිබුණි. | එකඟ වෙමි. ආදායම් ගිණුමට බැර කිරීමට කටයුතු කරමි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගත යුතුවේ. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා අනුරූපී වාර්තා අනුව ශේෂයන් අතර විෂයන් 03 කට අදාලව එකතුව රු.14,231 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනස නිවැරදි කිරීමට කටයුතු කල යුතුවේ. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.789,395,235 ක් වූ ගිණුම් විෂයන් 03 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඔප්පු හා පැවරුම්පත් ශේෂ සනාථ කිරීම් ලබාගෙන විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2004/10/11 අයවැය චක්‍රලේඛ අංක 118 1.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු7,028,139ක් වූ අතර, එයින් විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා මිය ගිය සේවකයින් 54 දෙනෙකුගෙන් අයවිය යුතු රු.119,763ක් වූ ණය ශේෂය වර්ෂ 05කට වැඩි කාලයක සිට හිඟව පවතින අතර අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි. | ලිඛිතව දැනුම් දී ඇත. එසේම ණය මුදල් ලබාගෙන දැනට මිය ගොස් ඇති අය ලබා ගන්නා ලද ණය මුදලට කිසිදු ඇපකරු වාර්තාවක් නොමැති වීම මත අයකර ගැනීම ගැටළුවක් වී ඇති බව දන්වමි. | කඩිනමින් අයවිය යුතු සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,755,273ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,362,687ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) <u>වරිපනම් හා බදු</u> | | |
| (i) සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.11,851,320 ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදලින් සියයට 50 ක ප්‍රමාණයක් මෙම වසර තුළ අය කිරීමට සැලසුම් කර ඇත. | හිඟ බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) ප්‍රාදේශීය සභාව වරිපනම් බදු අය කරනුයේ කල්පිටිය නගර සීමාව තුල පමණක් වූ අතර අනෙකුත් දියුණු නගර හා ප්‍රධාන මාර්ගය දෙපස දේපළ තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | නව වරිපනම් කොට්ඨාශ 06 ක් GPS තාක්ෂණය මගින් සිතියම් ගත කර අවශ්‍ය විස්තර ලබා ගැනීම අවසන් කර ඇති අතර ගැසට් කිරීමට කටයුතු කරමින් පවති. | දියුණු නගර හා ප්‍රධාන මාර්ගය දෙපස දේපළ තක්සේරු කර ගැසට් කිරීමෙන් පසු වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) **අක්කර බදු** | | |
| සමීක්ෂණයක් සිදු කර අක්කර බදු අයකල යුතු ඉඩම් හඳුනා ගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අක්කර බදු හිඟය වූ රු.945,585 ක මුදල අයකර ගැනීමටද ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි. | බදුකරුවන් නිවැරදිව හඳුනා ගැනීමෙන් පසු හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | කඩිනමින් හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) **ජල බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ජල බදු ප්‍රමාණය රු.393,584 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බදු මුදල් ගෙවන ලෙස දන්වා ලිපි යවා ඇති අතර කොටස් වශයෙන් බදු අය වෙමින් පවතින බව දන්වමි. | හිඟ බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ඈ) **කුලී**

| | | |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,218,776 ක් කඩ කුලී හා බදු කුලී හිඟයක් පැවතුණු අතර කඩ කාමර 134 ක ගිවිසුම් කාලය අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ බදු ගෙවිය යුතු පුද්ගලයින් පිළිබඳව තොරතුරු සොයා ගැනීම ගැටළුවක්ව පවතී. අනෙකුත් කඩ කාමර සම්බන්ධ හිඟ මුදල් අයකර ගැනීම සඳහා එන්තරවාසි නිකුත් කර ඇත. | හිඟ බදු කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) මස් කඩ හා දේපළ බදුදීම මගින් අයවිය යුතු රු.4,617,535 ක් අයකර ගැනීමට හෝ ගෙවීම් පැහැර හරින පුද්ගලයින් වෙනුවෙන් නීතිමය කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි. | ණය මුදල් ආදායම් පරික්ෂක මහතුන් ලවා අදාළ වාර්තා රැස්කර ඉදිරි මහ සභාවට යොමු කර කපා හැරීම සම්බන්ධව තිරණයක් ගැනීමට නියමිතය. | වර්ෂය තුල බිල්කළ කුලී වර්ෂය තුලදීම අයකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් හා කුලී නොගෙවූ පුද්ගලයින් පිළිබඳව නීතිමය වශයෙන් කටයුතු කළ යුතු වේ. |

(ඉ) **බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල්වලින් පෙර වර්ෂයේ ආදායම් මත සියයට 01ක ගාස්තුවක් වශයෙන් රු.847,918ක් අය කර තිබුණද එම අයකිරීම් විගණිත වාර්තා මත තහවුරු වූ තථ්‍ය ආදායම් මත පදනම්ව සිදුකර නොතිබුණි. | ඉදිරියේදී බලයලත් ආයතනයක් විසින් සකස් කරන ලද ගිණුම් වාර්තා ලබාගැනීමෙන් පසු මෙම හොටල් වලින් ගාස්තු අයකිරීමට කටයුතු කරමි. | විගණිත වාර්තා මත තහවුරු වූ තථ්‍ය ආදායම් මත බලපත්‍ර ගාස්තු අයකළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රදර්ශන දැන්වීම් පුවරු 29ක් මගින් ප්‍රාදේශීය සභාවට ලබාගත හැකිව තිබූ රු.70,250ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ආයතන සහ පුද්ගලයින් වෙත ලිපි යවා ඇති අතර, මේ වන විට ගාස්තු අයවෙමින් පවතී. | ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කන්දකුලිය උතුර ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීමේදී නිසි ලෙස මැනුම් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.59,848 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් රැඳවුම් මුදලින් අඩුකර ගෙවීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව දන්වමි. | වගකීමෙන් තොරව කටයුතු කල නිලධාරින් පිළිබඳව නීති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවීම් අයකළ යුතුවේ. |
| (ආ) | කොරෝනා වසංගතය කල්පිටිය අර්ධද්වීපයේ පැතිර යාම වළක්වා ගැනීම සඳහා විෂබීජහරණය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අනුමත ආකෘතිපත්‍ර භාවිතා නොකර කල්පිටිය අර්ධද්වීපයට පැමිණෙන වාහන විෂබීජහරණය කර වාහනයකින් රු.100 බැගින් රු.967,800 ක් අයකර සභාවේ ආදායමට ගෙන තිබුණි. | අධික වාහන තදබදය නිසා පිටපත් 4කින් යුත් ප්‍ර.ස. 1 බිල්පත් කාබන් කොළ යොදා ගනිමින් රිසිට්පත් නිකුත් කිරීම ප්‍රායෝගිකව අපහසු වූ රෝනියෝ කොළවල මුද්‍රණය කළ රිසිට්පත් නිකුත් කිරීම සිදු කර ඇති බව දන්වමි. | මුදල් අයකිරීමේදී සභාවේ සාමාන්‍ය ලදුපත් භාවිතා කලයුතු අතර පවතින නීතිරීති වලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීමට අවශ්‍ය සම්පත් සභාව සතුව පැවතියදී සභාවේ තීරණයක් මත රු.3,244,255 ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් හට අවස්ථාව ලබා දී තිබුණි. | කොරෝනා වසංගතය හේතුවෙන් ක්‍රියාත්මක කර ගැනීමේ බාධාවන් මත පිළිගත් ග්‍රාමීය සමිති මගින් අදාල මාර්ග සංවර්ධනය කර ගැනීමට කොන්ත්‍රාත් ලබාදුන් බව දන්වමි. | සභාවට වාසිදායක ආකාරයට අරමුදල් උපයෝජනය කළ යුතුවේ. |
| (ඈ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ලබාදී තිබූ කොඩි කණු 464න් රු.280,594ක් වටිනා කොඩි කණු 219ක් සම්බන්ධ තොරතුරු ප්‍රාදේශීය සභාව සතුව නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට හෝ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අස්ථාන ගතවී ඇති කොඩි කණුවල වටිනාකම හා 25% රජයේ ගාස්තුවද ඇතුලත්ව අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | නීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |